**Abstract No: HSS 37** **Humanities, and Social Sciences**

# ලාංකේය සිනමාව, කර්මාන්තමය දුබලතා සහ ප්‍රචාරණ ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක්

**ඒ. එම්. ටී. ඩී. අබේසිංහ**[1*]

[1]ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සිනමාව කලාවක් ද කර්මාන්තයක් ද වේ. ලාංකේය සිනමාවේ කර්මාන්තමය ස්වරූපය සහ ප්‍රචාරණ ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයේ දී ගෝලීය හා කලාපීය වශයෙන් සාර්ථක කලාත්මක සිනමාවක් දේශීය සිනමාව තුළ හඳුනාගත හැකිය. නමුත් සිනමාව කර්මාන්තයක් ලෙස වර්ධිත ලොව සෙසු රටවල හඳුනාගත හැකි කර්මාන්තමය ලක්ෂණ ලාංකේය සිනමාව තුළ හඳුනාගැනීම අසීරුය. කර්මාන්තමය වශයෙන් වර්ධිත හොලිවුඩ් සහ බොලිවුඩ් ප්‍රමුඛ කලාපීය රටවල සිනමා කර්මාන්ත තුළ හඳුනාගත හැකි ලක්ෂණ මොනවාද යන්නත්, ඒවා ලාංකේය සිනමාව තුළ කවරාකාරයකින් ක්‍රියාත්මක වී ඇති ද යන්නත් අධ්‍යයනයට පාත්‍ර වී ඇත. එසේම කලාපීය රටවල සිනමාව ප්‍රචාරණය සඳහා භාවිත දියුණු තාක්ෂණික හා නිර්මාණාත්මක ක්‍රමවේද මොනවාද යන්නත්, ලාංකේය සිනමාව ප්‍රචාරණය සඳහා භාවිත ප්‍රචාරණ ක්‍රමවේදයන්ගේ ස්වරූපය කවරාකාරද යන්නත් මෙහි මූලික පර්යේෂණ ගැටලුව ලෙස හඳුනාගෙන ගැනේ. සසම්භාවී නියැදි ක්‍රමය යටතේ ජීවත්වන ප්‍රදේශය (නාගරික, අර්ධ නාගරික, ග්‍රාමීය), ස්ත්‍රී පුරුෂ ගතිකත්වය, වයස, වෘත්තිය හා මාසික ආදායම යන විචල්‍ය මත පදනම්ව අහඹු ලෙස තෝරාගත් ප්‍රේක්ෂකයන් වෙත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරමින් දත්ත ඒකරාශී කරන ලදි. එම දත්ත ඉහත විචල්‍ය සමග සංසන්දනය කරමින් වෙන් වෙන් වශයෙන් තේරීමට බඳුන් කර විශ්ලේෂණයට ලක් කෙරිණි. ඒ අනුව ලාංකේය සිනමා ප්‍රේක්ෂකයාගේ සිනමාව විෂයෙහි පවත්නා රුචිකත්වය කවරාකාරද යන්නත්, ලාංකේය සිනමාවේ කර්මාන්තමය පසුබිම වර්ධනය උදෙසා භාවිත කළ හැකි ක්‍රමවේද මොනවාද යන්නත් අධ්‍යයනය මගින් හඳුනාගත හැකි විය. ලාංකේය ප්‍රේක්ෂකයා තුළ සිනමාව හා සම්බන්ධ ගැඹුරු සාවධාන හෘදයංගම ඇසුරක් ගොඩනැගීම සඳහා භාවිත කළ හැකි ප්‍රචාරණ මාධ්‍යයන් මොනවාද යන්න අනාවරණය කොටගත හැකි විය. එසේම ලාංකේය ප්‍රේක්ෂක විඥ්ඥාණයට ආමන්ත්‍රණය කළ හැකි චිත්‍රපට සහ වඩාත් රුචිකත්වයක් දක්වන සිනමා ශානරවලට අයත් සිනමා කෘති නිර්මාණය ඔස්සේ සිනමා ශාලාව හැර ගිය ප්‍රේක්ෂකයා යළි සිනමා ශාලාව වෙත රැගෙන ඒමට ඉහළ අවකාශයක් පවතින බව අනාවරණය විය. සිනමා ප්‍රේක්ෂකයාගේ රුචිකත්වය මත පදනම්ව ප්‍රචාරණ මාධ්‍ය තෝරාගැනීමත්, ඒ ඔස්සේ සිනමාව ජනගත කිරීම තුළින් ඉහළ ප්‍රේක්ෂකත්වයකට ආමන්ත්‍රණය කිරීමටත් අවකාශ හිමි වන බව හඳුනාගත හැකි විය.

**මුඛ්‍ය පද :** ප්‍රචාරණය, ප්‍රචාරණ මාධ්‍ය, ප්‍රේක්ෂකත්වය, ප්‍රේක්ෂක විඥ්ඥාණය, සිනමා ශානර

* deepthikaabeysinghe@gmail.com